DOI: 10.31357/fhssmst.2009.00050

# ශ්‍රී ලංකාවේ වංචා - දූෂණ හා ජනමාධ්‍යවේදීන්ට තොරතුරු වලට ප්‍රවේශවීමට ඇති අයිතිය

ආනන්ද ධර්මප්‍රිය කොහොඹන් වික්‍රම ජයසේකර

ශාස්ත්‍රපති/ජනසන්නිවේදනය

# ශ්‍රී ලංකාවේ වංචා - දූෂණ හා ජනමාධ්‍යවේදීන්ට තොරතුරු වලට ප්‍රවේශවීමට ඇති අයිතිය

ආනන්ද ධර්මප්‍රිය කොහොඹන් වික්‍රම ජයසේකර

GS/HU/1626/2002

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා
ජනසන්නිවේදන විෂයය යටතේ
ඉදිරිපත් කරන නිබන්ධයයි.

මෙම ශාස්ත්‍රීය නිබන්ධය මා විසින් සම්පාදනය කරන ලද බවත් මෙම අධ්‍යයනය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි

.................................................

අපේක්ෂකයාගේ අත්සන

GS/HU/1626/2002

30 NOV 2009

## පටුන


කෙටි සටහනක්

හැඳින්වීම

1. **වංචා - දූෂණ පිළිබඳ විමසුමක්**

1.1 දූෂණය යනු කුමක්ද ? **1-4**

1.1.1 දූෂණයේ ප්‍රතිවිපාක ගැන ආගමික ඉගැන්වීම්

1.2 දූෂණයේ විවිධ ස්වරූපයන් සහ ක්‍රියාවන් **5-9**

1.3 දූෂණයේ පිරිවැය සහ ප්‍රතිවිපාක **10-20**

1.3.1 ශ්‍රී ලංකාවේ දූෂණ මට්ටම

1.3.1.1 වැට් බදු වංචාව

1.3.1.2 කෝප් වාර්තා මගින් හෙලිවූ දූෂණ

1.4 දූෂණ මැඩලීමේ දේශීය හා විදේශීය යාන්ත්‍රණ හා නීති **21-27**

1.4.1 ශ්‍රී ලංකාවේ අල්ලස් හෝ දූෂණ පිළිබඳ නීතිය

2. **වංචා දූෂණ පිළිබඳ ජනමාධ්‍යයේ භූමිකාව** **28-34**

2.1. වංචා දූෂණ පිළිබඳ ගවේෂණාත්මක වාර්තාකරණය

2.1.1 වංචා දූෂණ වාර්තාකරණය පිළිබඳ ශ්‍රීලංකාවේ තත්ත්වය

3. **තොරතුරු වලට ප්‍රවේශවීම**

3.1 තොරතුරු දැනගැනීමේ අයිතිය **35-42**

3.1.1 දූෂණ හෙළිදරව් කිරීම සඳහා තොරතුරු නිදහස උපයෝගී කරගැනීම

3.1.2 තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වෙනත් රටවල ඇති ප්‍රවේශයන්

3.2 ශ්‍රී ලංකාවේ තොරතුරු වලට ප්‍රවේශවීමට ඇති සීමා හා බාධක **43-53**

3.2.1 මූලාශ්‍ර පිළිබඳ මතුවන ආචාර ධර්මීය ගැටලු

3.2.2 ආයතන සංග්‍රහය යටතේ රාජ්‍ය නිලධාරීන්ට පනවා ඇති සීමා

3.2.3 පුවත්පත් මණ්ඩල නීතිය මගින් පැනවී ඇති සීමා

3.3 ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිය දිනාගැනීමේ උත්සාහයන්... 54-62

3.3.1 තොරතුරු දැනගැනීම පිළිබඳ ස්වාධීන කෙටුම්පත

4. වංචා - දූෂණ හෙළිදරව් කිරීමේ නිරත ජනමාධ්‍යවේදීන්ට මුහුණදීමට සිදුවී ඇති අභියෝග 63-73

5. නිගමන හා සමාලෝචනය 74-76

5.1 ජනමාධ්‍යවේදීන්ට තොරතුරු වලට ප්‍රවේශවීමේ අයිතිය ලබාදීම තුළින් ශ්‍රීලංකාවේ වංචා-දූෂණ නතර කළ හැකිද ?

6. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 77

7. උප ග්‍රන්ථය

## කෙටි සටහනක්

තොරතුරුවල විශේෂ වටිනාකමක් ඇති බවත්, සඟවාගෙනසිටින තොරතුරක් සොයා ගත් විට එහි වඩාත් වැඩි වටිනාකමක් පවතින බවත් මුල්වරට ඉගෙන ගත්තේ තාත්තාගෙනි.

දීර්ඝ කාලයක් තිස්සේ වෘත්තීය සමිති හා විවිධ සමාජ සේවා කටයුතුවල නිරත වූ තාත්තා ඇතැම් අවස්ථාවල පුංචි තොරතුරක් ගැන දැන ගැනීමට සැතපුම් 10 -15ක් බයිසිකල් පදිමින් දින සති මාස ගණන් ආණ්ඩුවේ කන්තෝරුවල රස්තියාදු වෙමින් අපරිමිත වෙහෙසක් දැරුවේ ය.

රාවය කර්තෘ මණ්ඩලයේ පුවත්පත් කලාවේදියෙකු ලෙස රැකියාව ඇරඹූ මුල් වසරේ සිටම රටේ පුරවැසියන් විසින් දැන ගත යුතු තොරතුරු ඔවුන්ගෙන් ඈත් කර තැබීම හා එමඟින් මතුවන විවිධ සමාජ, ආර්ථික හා දේශපාලන ගැටලු පිළිබඳව මගේ විශේෂ අවධානයක් යොමු විය.

තොරතුරු දැන ගැනීමේ අයිතිය (Right to Information) සංකල්පයක් වශයෙන් හඳාරන්නට ලැබුණේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හි කාර්ය මණ්ඩලයට එක්වීමට ලැබීමත් සමඟය. ඒ පිළිබඳ ලෝකය පුරා විවිධ තලවල පවත්නා සංවාද කියවන්නට අසන්නට ලැබීමත් සමඟ අපේ තාත්තා සහ තාත්තාලාගේ පරපුරේ ගැමියන් එදා සිට අද දක්වා ම තොරතුරු දැන ගැනීම වෙනුවෙන් විඳිමින් සිටින දුෂ්කරතා අවම කිරීම සඳහා යම් කාර්යභාරයක් ඉටු කිරීමේ සමාජයීය වුවමනාවක් මා තුළ වර්ධනය වෙමින් පැවතිණි.

දූෂණ හෙළිදරව්ව කිරීමේ නිරතවූ පත්තරකාරයෙක් ලෙස මාධ්‍ය ක්‍රියාවලියේ දී තොරතුරු ලබාගැනීම සඳහා විඳින්නට සිදුවූ දුෂ්ක රතාවල අත්දැකීම් ද එක්කරමින් මෙම නිබන්ධය මඟින් ශ්‍රී ලංකාවේ වංචා - දූෂණ හා ජනමාධ්‍යවේදීන්ට තොරතුරු සඳහා ප්‍රවේශවීමට ඇති අයිතිය අතර යම් සම්බන්ධතාවයක් හඳුනාගැනීමට උත්සාහ කළෙමි. එම උත්සාහය ද ශ්‍රී ලංකාවේ තොරතුරු

දැනගැනීමේ අයිතිය දිනා ගැනීම සඳහා සිදු කෙරෙන අරගලයට යම් පමණකින් හෝ දායකත්වයක් සපයනු ඇතැයි විශ්වාස කරමි.

අපව දැනුමින් පොහොසත් කිරීම සඳහා වෙහෙසුනු ජනසන්නිවේදන ශාස්ත්‍රපති පාඨමාලාවේ සම්බන්ධීකාරක, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය ද, මෙම කාර්යයේ දී මා වෙත නන් අයුරින් සහාය දැක්වූ සියලු දෙනාට ද මාගේ ස්තුතිය පුද කරමි.

මගේ අත්පිටපත මුද්‍රිත අකුරුවලින් යුත් නිබන්ධනයක් බවට පත් කිරීමේ කාර්යයේ දී පරිගණක අක්ෂර සංයෝජනයෙන් හා පිටු සැකසීමෙන් සහාය වූ චාමලී නිසංසලා, ශ්‍රී ලාල් සෙනෙවිරත්න හා නන්දසිරි ධර්මරත්න සොයුරු සොයුරියන්ගෙන් ලැබුණු සුවිශේෂ සහය පිළිබඳව විශේෂයෙන් සටහන් කළ යුතුය.

මෙම නිබන්ධයේ කටයුතු අවසන් වන තෙක් ම කුටුම්භයේ සියලු දුෂ්කරතා තනිවම විඳදරා ගනිමින් මට ලියන්නට විවේකය සලසා දුන් ආදරණීය බිරිඳ සුජීවාටත්, 'තාත්තා පොත ලියල ඉවර වෙනකම් මම චිත්‍ර අඳින්නම්' යැයි පවසමින් මට අවහිර නොකර සිතුවම් කිරීම තෝරා ගත් පුංචි පුතු යසිත නිම්නක ටත්, මේසය මත නැඟී මගේ අත්පිටපත්වල බලිකුරුටු අඳිමින් අසීමිතව කරදර කළ මෙත්මි තනුවිනී පුංචි දියණියටත් මගේ අවංක ආදර ස්තුතිය හිමි වේ

ආනන්ද ධර්මප්‍රිය ජයසේකර
anandadj@gmail.com
2009-11-28

# හැඳින්වීම

වංචා - දූෂණ යනු මොනවාදැයි නිශ්චිතව හැඳින්විය හැකි පරිපූර්ණ අර්ථකථනයක් මෙතෙක් ඉදිරිපත්වී නොමැත. දූෂණයට එරෙහි ජාත්‍යන්තර ජාලයක් ලෙස ලොව පුරා රටවල් 90 කට වැඩි සංඛ්‍යාවක ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානයට අනුව 'පැවරී ඇති බලය පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා අයථා ලෙස පරිහරණය කිරීම' දූෂණය ලෙස හැඳින්වේ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානය විසින් ලෝකයේ රටවල් 180 ක් ආවරණය වන පරිදි ඒ ඒ රටවල පවත්නා දූෂණ මට්ටමේ ප්‍රමාණය සමීක්ෂණ මගින් වාර්ෂිකව මැන බැලෙන අතර එම දර්ශකයන්ට අනුව (CPI index) ශ්‍රීලංකාව පවතිනුයේ ක්‍රමක්‍රමයෙන් දූෂිත තත්ත්වය වර්ධනය කරගනිමින් පරිහානියට පත්වන තත්ත්වයකය. 2009 වසරේ රටවල් 180 ක් අතර ශ්‍රී ලංකාවට හිමිවී තිබෙන්නේ 97 වැනි ස්ථානයයි.

ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය අනුවද (World wide press freedem index) ශ්‍රී ලංකාව පවතිනුයේ රටවල් 173 ක් අතර 165 වැනි ස්ථානය තරම් නරක තැනකය. ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිය නොමැතිකමේ ප්‍රශ්ණය ජාත්‍යන්තර දර්ශක කිහිපයක් මගින්ම ප්‍රමුඛ කරුනක් ලෙස පෙන්වාදී තිබේ.

රටක පවත්නා දූෂණය හා තොරතුරු දැනගැනීමේ අයිතිය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව සිදුකරන ලද සමීක්ෂණයන් පිළිබඳ තොරතුරු හමුනොවේ. එහෙත් 2002 වසරේ දූෂණ සංජනන දර්ශකයේ තොරතුරු විග්‍රහ කරමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය පෙන්වාදී ඇත්තේ එම දර්ශකය අනුව හොඳම රටවල් බවට පත්වූ රටවල් දහය අතරින් අටකට වැඩි ප්‍රමාණයක ජනතාවට අදාළ රාජ්‍යයන්හි ලිපිගොණු පරීක්ෂාකර බැලීමට හැකියාව ලබාදෙන ඵලදායී ව්‍යවස්ථා සම්පාදන තිබූ බවයි. එසේම වඩාත් දූෂිත ලෙස පිළිගැනුන, එම දර්ශකයේ අවසානයේ පසුවූ රටවල් දහය අතරින් අඩුම වශයෙන් එකම රටකටවත් ආණ්ඩුවේ

තොරතුරු වලට කිසිඳු ප්‍රවේශයක් නොතිබූ බවද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය පෙන්වාදී තිබිණි

ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවත්නා වංචා දූෂණ හා ජනමාධ්‍යවේදීන්ට තොරතුරු වලට ප්‍රවේශවීමට ඇති අයිතිය අතර කිසියම් සබඳතාවයක් පවතින්නේදැයි සොයා බැලීම මෙම අධ්‍යනයේ අරමුණ විය. ඒ සඳහා ඍජුව හෝ වක්‍රව ආධාර කරගත හැකි පර්යේෂණයක් මෙතෙක් ශ්‍රී ලංකාවේ සිදුවී නොමැතිවීම නිසා බොහෝ අවස්ථාවල මූලික තොරතුරු සොයා යමින් මෙම නිබන්ධයට කරුණු ගොණුකර ගැනීමට සිදුවිය.

2003 වර්ෂයේදී මාධ්‍ය සංවිධාන හා සිවිල් සමාජයේ සහභාගීත්වය ඇතිව ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතක් ස්ථාපිත කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කරන ලද නමුත් එය පාර්ලිමේන්තුවෙන් සම්මතවීමට ප්‍රථම පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීම නිසා එය අතහැරී ගිය අගනා අවස්ථාවක් බවට පත්විය.

'දූෂණය' විෂයය අධ්‍යනය කරන්නෙකුට තරමක් ආගන්තුක විෂය ක්ෂෙත්‍රයක්වීම නිසා මෙම නිබන්ධයේ මුල් පරිච්ඡේදය මගින් දූෂණය, එහි විවිධ ස්වරූපයන් හා ක්‍රියාවන්, දූෂණයේ පිරිවැය සහ ප්‍රතිවිපාක, දූෂණය වැළැක්වීම පිළිබඳව දේශීයව හා විදේශීයව පවත්නා නීති හා දූෂණ මැඩලීමේ යාන්ත්‍රණ ආදී මූලික කාරණා සියල්ල තරමක් විස්තරාත්මක ලෙස සාකච්ඡා කර තිබේ. විදෙස් යාන්ත්‍රණ පිළිබඳව කෙටියෙන් හෝ කරුණු දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවට එම විෂය පිළිබඳව ආදර්ශයට ගැනීමට ඇත්තේ එම තොරතුරු වන බැවිනි.

නිබන්ධයේ දෙවැනි පරිච්ඡේදය මගින් වංචා දූෂණ පිළිබඳව ජනමාධ්‍යයේ භූමිකාව සාකච්ඡා කෙරෙන අතර එහිදී වංචා - දූෂණ ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳවත්, ගවේෂණාත්මක වාර්තාකරණයේ ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳවත් මීට පෙර සිදුකර ඇති සමීක්ෂණයක් ආශ්‍රය කරගනිමින් කරුණු ඉදිරිපත්කර තිබේ.

නිබන්ධයේ තෙවැනි පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු වලට ප්‍රවේශවීමේදී මුහුණදීමට සිදුවී ඇති සීමා හා බාධක පිළිබඳවත්, ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිය දිනාගැනීමට ගන්නා ලද උත්සාහයන් පිළිබඳවත් අවධානය යොමුකර තිබේ. තොරතුරු වල වටිනාකම සලකා වෙනත් රටවල තොරතුරු දැනගැනීමේ අයිතියට ඇති ප්‍රවේශයන් පිළිබඳවද සැකෙවින් විස්තර කර ඇත.

නිබන්ධයේ සිව්වන පර්ච්ඡේදය මගින් මෙම අධ්‍යනය සඳහාම විශේෂයෙන් එක්රැස් කරගත් මුල් තොරතුරු ඇතුළත්කරමින් වංචා - දූෂණ හෙළිදරව් කිරීමේ නිරත ජනමාධ්‍යවේදීන්ට මුහුණ දීමට සිදුවී තිබෙන අභියෝග පිළිබඳව සාකච්ඡා කරතිබේ. එම පරිච්ඡේදයට ඇතුළත් කර ඇත්තේ කර්තෘවරු, ගවේෂණාත්මක ජනමාධ්‍යවේදීන්, මාධ්‍ය ක්‍රියාකාරීන්, පුහුණුවන මාධ්‍යවේදීන්, ආදී ජනමාධ්‍යයේ විවිධ ක්ෂෙත්‍රයන් නියෝජනය කරන පිරිසක් සමග 'දූෂණය හා තොරතුරු දැනගැනීමේ අයිතිය' සම්බන්ධයෙන් සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා මගින් ලබාගත් අදහස්වල සම්පිණ්ඩනයකි.

නිබන්ධයේ බොහෝ තැන්වලට ඇතුළත් කර ඇති උපුටා ගැනීම් එසේ ඇතුළත් කරන ලද්දේ ප්‍රස්තුතයට අදාළ කරුණු ගැන වැඩිදුරටත් අධ්‍යනය කරන්නෙකුට එමගින් ප්‍රයෝජනයක් අත්වනු ඇතැයි විශ්වාස කළ බැවිනි. එසේම වැඩිදුර අධ්‍යනයේ පහසුව සළකා දැනට අප්‍රකාශිත ලියැවිල්ලක් ලෙස සැකෙන කැබිනට් මණ්ඩලය මගින් සම්මත කරන ලද තොරතුරු දැනගැනීමේ පනතද උපග්‍රන්ථයට ඇතුළත්කර තිබේ.

# 1. වංචා - දූෂණ පිළිබඳ විමසුමක්

## 1.1 දූෂණය යනු කුමක්ද ?

"දූෂණය යනු කුමක්ද ? යන්නට ලොව පුරා පිළිගත්, නිශ්චිත, පරිපූර්ණ අර්ථකථනයක් මෙතෙක් ඉදිරිපත් වී නොමැත. එහෙත්, අල්ලස හා දූෂණය මානව ශිෂ්ඨාචාරයේ ආරම්භක අවධියේ සිටම විශ්වීය සංසිද්ධියක් ලෙස පැවැතී ඇති බවත්, ඉතිහාසය පුරාම "දූෂණය" දඬුවම් හිමිවිය යුතු වරදක් ලෙස සැලකී ඇති බවටත් සාක්ෂි හමුවේ.

ක්‍රි.පූ. 46 තරම් ඈත වකවානුවේ චීනයේ ගාඕ තාඕ විසින් සාදන ලද දූෂණ මර්දන නීති චීනයේ ෂියා රාජ වංශය විසින් ක්‍රියාත්මක කරන ලද බවට ඓතිහාසික සාධක හමුවේ එකල දූෂණයට දඬුවම වී ඇත්තේ නලලේ හංවඩුවක් ගැසීමය. පසු කාලීනව චීන රාජවංශ ධූරාවලිය තුළ "දූෂණය" සඳහා වරදේ බරපතලකම අනුව මරණීය දණ්ඩනය පනවා තිබේ. වර්තමානයේද චීනයේ 'දූෂණය' වරදට මරණීය දණ්ඩණය ක්‍රියාත්මක වෙයි.

ක්‍රි.පූ. 70 දී සිසෙරෝ රෝම අග්‍ර විනිශ්චයකාර හොග් හට එරෙහිව දූෂණ චෝදනා යටතේ නඩු පවරා ඇතැයි ඓතිහාසික සාධක වලින් කියැවේ.[1]

> *මහජන දේපළ භාරව සිටින රාජ්‍ය නිලධාරීන් එකී දේපල පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදා ගන්නේදැයි සෙවීම ජලයේ පිහිනන මාලුවෙකු එම ජලය බීමට ගන්නේදැයි සෙවීම" මෙන් දුෂ්කර යැයි*

රාජ්‍ය නිලධාරීන්ගේ දූෂණ පිළිබඳව අනතුරු අඟවමින් කෞටිල්‍ය සිය අර්ථ ශාස්ත්‍රය ග්‍රන්ථයේ දක්වා තිබේ.

වසර හාරදහසක් පැරණි ඇසිරියාවේ මැටි තීරුවල සිට ඉතා නූතන සාහිත්‍යය දක්වා ලෝක සාහිත්‍යය තුළද දූෂණය පිළිබඳ විවිධ සඳහන් කිරීම් හමුවේ.

---

[1] A.K. Chandrakantha TOWARDS A NATION OF INTEGRITY, TISL Publications

*"දූෂණය ගසකට උපමා කරන බියුමොන්ට් හා ෆ්ලේඩර් යන නාට්‍යකරුවන් ප්‍රකාශ කර ඇත්තේ එහි මුල් ඇදගත් විට එහි අතු මැනිය නොහැකි තරම් දිගු වන අතර සෑම තැනකම පැතිරී යන බවයි"*[2]

බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ 1883 දී සම්මත කරන ලද දණ්ඩ නීති සංග්‍රහය මගින් අල්ලස ශ්‍රී ලංකාව තුළ නෛතික වරදක් ලෙස නම් කර තිබේ.[3]

ශ්‍රී ලංකාවේ සේවාවන් හිදී සිදුවන අල්ලස් ක්‍රියා ඉලක්ක කර ගනිමින් 1954 වර්ෂයේදී මුල් වරට අල්ලස් පනතක් හඳුන්වා දෙනු ලබන අතර 1954-අංක-11 දරණ එම පනත වර්තමානය වනවිට, 1956 අංක 17, 1958 අංක 40, 1965 අංක 02, 1965 අංක 18, 1973 අංක 08, 1974 අංක 38, 1976 අංක 11, 1980 අංක 9, 1994 අංක 19 හා 1994 අංක 20 දරණ පනත් වලින් සංශෝධනයට ලක්ව ක්‍රියාත්මක වෙමින් පවතී.

2002 වර්ෂයේදී දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සාකච්ඡාවට බඳුන් කිරීම ආරම්භ වූ අවස්ථාවේදී ද 'දූෂණය' අර්ථ නොදක්වා ඒ වෙනුවට දූෂණයේ ස්වරූපයන් හෝ ක්‍රියාවන් ලැයිස්තුගත කිරීමට එකගත්වයක් ඇතිකරගෙන තිබේ. ඒ අනුව දූෂණයේ ප්‍රධාන ස්වරූපයන් සහ ක්‍රියාවන් පහත පරිදි ප්‍රධාන සංකල්පයක් හතරකට බෙද දක්වා තිබේ.[4]

- අල්ලස (Bribery)
- මහජන මුදල් වංචා කිරීම (Embezzlement)
- වංචාව (Fraud)
- බලහත්කාරයෙන් මුදල් ලබාගැනීම (Extortion)

මෙම සංකල්ප අර්ධ වශයෙන් එකක් මත එකක් ක්‍රියාත්මක වන විට හෝ එසේම අනෙකුත් සංකල්ප සමඟ අන්‍යොන්‍ය වශයෙන් හුවමාරුවන විට පවා මේ හරහා දූෂණයේ ලක්ෂණ හඳුනාගත හැකිය.

---

[2] Judge C.G. Weeramantry, National Anti-Corruption Conference BMICH, 28 July 2007 (Keynote address)

[3] 1883 අංක 3 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ 158,159 හා 160 වගන්ති.

[4] රාජ්‍ය සේවය සඳහා දූෂණ විරෝධී අත්පොත, SLIDA, TISL ප්‍රකාශයකි - පිටුව 01

දූෂණය නිර්වචනය කරනු ලබන පොදුවේ පිළිගත් නිර්වචන සෑම එකකම පාහේ ඉහත ස්වරූපයන් හා ක්‍රියාවන් පිළිබඳව අවධානය යොමුකර තිබේ.

ලෝක බැංකුව දූෂණය නිර්වචනය කර ඇත්තේ,

*"රජයේ තනතුරු තම පෞද්ගලික ප්‍රයෝජනය උදෙසා වැරදි අන්දමින් යොද ගැනීම" යනුවෙනි.*

*"අල්ලස ලබාගන්නා පුද්ගලයාගෙන් සිදුවිය යුතු රාජකාරිය හෝ ඔහුගෙන් වියයුතු හැසිරීම් රටාවෙන් වෙනස්වන අන්දමින් ඍජුව හෝ වක්‍රව අල්ලසක් හෝ වෙනයම් වැරදි සහගත ලාභයක් ඉල්ලීම, පිළිගැන්වීම, දීම හෝ ලබාගැනීම "දූෂණයක්" යැයි යුරෝපා සංගමය නිර්වචනය කරයි.*

*"පෞද්ගලික හා රාජ්‍යය යන දෙඅංශ අතර සිදුවන, පොදු භාණ්ඩ නීති විරෝධී අන්දමින් පෞද්ගලික භාණ්ඩ බවට පත්කිරීම දූෂණය යැයි"*

Hiedenheimes et. Al 1993 නිර්වචනය කර තිබේ.

ලොව පුරා රටවල් 90 කට වැඩි සංඛ්‍යාවක ශාඛා කාර්යාල 105 ක් සහිතව දූෂණය මැඩලීම මුඛ්‍ය අරමුණ කරගනිමින් ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාලය දූෂණය අර්ථකථනය කර ඇත්තේ

*"පැවරී ඇති බලතල පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා අයථා ලෙස පරිහරණය කිරීම"[5] යනුවෙනි.*

### 1.1.1 දූෂණයේ ප්‍රතිවිපාක පිළිබඳ ආගමික ඉගැන්වීම්

බොහෝ ආගමික ඉගැන්වීම් වලද දූෂණයේ ප්‍රතිවිපාක හා දූෂණයෙන් වැළැකීමේ වැදගත්කම අවධාරණය කර තිබේ. බෞද්ධ ඉගැන්වීම් වල, රාජ්‍ය පාලනයේදී පිළිපැදිය යුතු කරුණු දහයක් පිළිබඳව සඳහන් වන අතර එම දසරාජ ධර්මයට යහපත් පාලනයද අයත්ය. දසරාජ ධර්මයේ කියැවෙන යහපත් පාලනයට අනුව

---

[5] "corruption means abuse of entrusted power for personal gain"- www.tisrilanka.org

අනුකම්පා රහිතව, සෑම මට්ටමකම දූෂණය මුළුමනින්ම තොරකිරීම හා බලාත්මක කිරීම රජයේ වගකීම වේ.

බෞද්ධ සාහිත්‍යයේ, කොසොල් රජු දුටු සිහින දහසය පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කරන හේතුඵල සම්බන්ධයට අනුව පස්වැනි සිහිනය ඍජු ලෙසම දූෂණයේ අයහපත් ප්‍රතිවිපාක හා සම්බන්ධය. ඉදිරිපසින් මෙන්ම පසුපසින්ද දිගු බෙල්ලක් ඇති, දෙපසින්ම ආහාර අනුභව කරන ඔළුදෙකේ අශ්වයා පිළිබඳ සිහිනය ගැන කොසොල් රජු කරන කරුණු විමසීමට පිළිතුරු දෙමින් බුදුරජුන් දේශනා කරන්නේ අනාගතයේ රජ දරුවෝ ලජ්ජා බියකින් තොරව අල්ලස් සහ දූෂණයට පෙළඹී පිරිහෙන බවය.

ක්‍රිස්තියානි දහමේ "නුඹලා සොරකම් නොකළ යුතු යැයි" ක්‍රිස්තුස් වහන්සේ සිය අනුගාමිකයින්ට ප්‍රකාශකර තිබේ. මනු රජුගේ නීති තුළ, විනිශ්චයකරුවන් හා නිලධාරීන් දූෂණයේ සැකයකින් පවා මිදිය යුතු බව සඳහන් වේ. ඉස්ලාම් දහමේ පාලකයින්ට ආදර්ශයක් ලෙස දක්වා ඇති කාලිප් රජවරුන්ගේ චරිත වලදී ඔවුන් පහන් දැල්වීමට භාවිතා කරන තෙල් වර්ග පවා පරීක්ෂාකාරී ලෙස වෙන්කර දක්වන තරමට රාජ්‍ය පාලනයේදී අව්‍යාජභාවය පිළිබඳ සංකල්පය විස්තර කර තිබේ. රාජකාරී කටයුතුවලදී හැර රාත්‍රියේදී කාලිප් රජවරුන්ගේ පහන් දැල්වීමට මහජනයාගේ තෙල් භාවිතා කිරීම වැරදි බව ඔවුන් කල්පනා කළ අතර හුදු සාමාජීය අවස්ථාවලදී ඔවුන්ගේ කාමර එළිය කිරීමට සිය පෞද්ගලික තෙල් භාවිතා කිරීම ඔවුන් වැදගත් ලෙස සැලකූ බව ඉස්ලාම් දහමේ සඳහන් වේ.[6]

---

[6] 2007-ජූලි-28 දින ජාතික දූෂණ විරෝධී සමුළුව අමතා විනිසුරු සී.ජී. වීරමන්ත්‍රී මහතා ඉදිරිපත් කළ දේශනය ඇසුරිණි.

## 1.2 දූෂණයේ විවිධ ස්වරූපයන් හා ක්‍රියාවන්

දූෂණයේ වඩාත්ම ප්‍රචලිත ආකාරය වනුයේ අල්ලසයි. දූෂණ ගැන සඳහන් කෙරෙන බොහෝ අවස්ථාවල "වංචා-දූෂණ", "අල්ලස්-දූෂණ" ආදී වශයෙන් භාවිතා වූවද 'අල්ලස' හෝ 'වංචා' යනු දූෂණය තුළ පවත්නා ස්වරූපයන් දෙකකි.

දූෂණයේ විවිධ ස්වරූපයන් පහත පරිදි සැකෙවින් හඳුනාගත හැකිය.

**අල්ලස (Bribery)**

යම්කිසි කාර්යයක් හෝ තීරණයක් ගැනීම පිළිබඳව අයුතු ලෙස බලපෑමක් කිරීම සඳහා යම් වාසියක් ලබාදීම, ලබාදීමට පොරොන්දුවීම, ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කිරීම අල්ලස ලෙස හැඳින්වේ. එම වාසිය හෙවත් ගෙවීම මුදලින්, මූල්‍යමය වටිනාකම ඇති භාණ්ඩ, සමාගම් කොටස්, අභ්‍යන්තර තොරතුරු, ලිංගික හෝ වෙනත් ආකාරයකින් ලබාදිය හැකිය.

මෙම අල්ලස ප්‍රදානය කරනු ලබන්නේ යම් ක්‍රියාවක් ඉටුකරවා ගැනීම වෙනුවෙන් හෝ එම ක්‍රියාව නොකර හැරීම, නැතහොත් වගකීම ඉටු නොකර සිටීම සඳහා විය හැකිය. අල්ලසකදී අල්ලස දෙන පාර්ශවය සේම අල්ලස් ගන්නා පාර්ශවයද එම ක්‍රියාව ඉටුවීම මගින් තෘප්තිමත් භාවයට පත්වෙයි. එම අයුතු ක්‍රියාව මගින් එහි වාසිය දෙපාර්ශවයටම ලැබෙන අතර එහි හානිය සිදුවන්නේ සමස්ථ සමාජයටය.

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී මෙවලම (United Nations Anti Corruption Toolkit) අල්ලසෙහි විවිධ ස්වරූපයන් රැසක් විස්තරාත්මකව දක්වා තිබේ.

කිසියම් නිලධාරියෙකු හෝ දේශපාලනඥයෙකු තම නිලබලය අයථා ලෙස පාවිච්චි කරමින් සිදුකරන බලපෑම (influence - peddling), මහජන සේවයට බැඳී සිටින පුද්ගලයින් (උදා :- රජයේ සේවකයින්) තමන්ගේ සේවය සැපයීම වෙනුවෙන් අයථා තෑගි, පාරිතෝෂික, වාසි හෝ කොමිස් ලබාගැනීම, බදු ගෙවීම් පැහැර හරින්නන් අත්හැර දැමීම බදු මුදල් අඩුවෙන් තක්සේරු කිරීම වැනි ක්‍රියා මගින් බදු මුදල් හෝ අනෙකුත් පිරිවැය වල වගකීමෙන් ගැලවීම සඳහා සංතෝසම් ලබාදීම, සේවයේ නියුක්තව නොසිටින සේවකයින්ට